සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2020 ජනවාරි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2020-01-25
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) ***ප්‍රස්තාර කොළ*** *සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රාග්ධනය සඳහා ඇති ප්‍රතිලාභය (reward) වන්නේ කුමක් ද?

(1) බදු කුලිය. (2) වේතන. (3) ලාභය. (4) පොලිය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳපොළ අරේථිකයකට රජය විසින් මැදිහත් වීම සඳහා තුඩුදෙන වඩාත්ම නිවැරදි හේතුව තෝරන්න:

(1) ලාභදායකත්වය උපරිම කිරීමට. (2) වෙළෙඳපොළ බිඳ වැටීම නිවැරදි කිරීමට.

(3) රැකියා සුරක්ෂිත කිරීමට. (4) වෙළෙඳපොළ ඉල්ලුම වැඩි කිරීමට.

**1.3** **X** සහ **Y** භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය සෘණ අගයක් නම්, එම භාණ්ඩ:

(1) බාල (Inferior) භාණ්ඩ වේ.
(2) අනුපූරක (complementary) භාණ්ඩ වේ.
(3) සාමාන්‍ය (normal) භාණ්ඩ වේ.
(4) ආදේශක (substitute) භාණ්ඩ වේ.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන්වීමට හේතුවක් වන්නේ කුමක් ද?

(1) එම භාණ්ඩයේ මිල පහත වැටීම.
(2) පාරිභෝගිකයන්ගේ ආදායම වැඩිවීම.
(3) එම භාණ්ඩයේ මිල වැඩිවීම.
(4) පාරිභෝගිකයන්ගේ ආදායම අඩුවීම.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළඳාමේ අවාසියක් වන්නේ කුමක් ද?

(1) නිෂ්පාදනයේ වැඩිවීම.
(2) වෙළෙඳ උච්චාවචනයන් අඩුවීම.
(3) සම්පත්වල උපරිම උපයෝජනය.
(4) හානිදායක භාණ්ඩ ආනයනය කිරීම.

**1.6** බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සඳහා උදාහරණයක් වන්නේ:

(1) කොමර්ෂල් බැංකුව.
(2) හැටන් නැෂනල් බැංකුව.
(3) ලංකා බැංකුව.
(4) ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

**1.7** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන්නේ:

(1) ආයෝජන කරුණු පිළිබඳව පුද්ගලයන්ට උපදෙස් දීමයි.
(2) ආනයනකරුවන්ට උපකාර සැපයීමයි.
(3) මූල්‍ය ස්ථායිතාවය පවත්වාගෙන යාමයි.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.8** දේශීය මුදල් ඒකකයකින් විදේශීය වෙළෙඳපොළකදී මිලදීගත හැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ:

(1) දේශීය මූර්ත අගය ලෙසයි.
(2) විදේශ මූර්ත අගය ලෙසයි.
(3) දේශීය නිල අගය ලෙසයි.
(4) විදේශ නිල අගය ලෙසයි.

**1.9** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වනුයේ:

(1) ඇමරිකානු ඩොලර් 3,924 කි.
(2) ඇමරිකානු ඩොලර් 4,102 කි.
(3) ඇමරිකානු ඩොලර් 3,800 කි.
(4) ඇමරිකානු ඩොලර් 4,200 කි.

**1.10** යම් රටකට, තවත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකට නිෂ්පාදනය කිරීමේ හැකියාව:

(1) සාපේක්ෂ වාසිය වේ.
(2) වෙළෙඳ අනුපාතය වේ.
(3) නිරපේක්ෂ වාසිය වේ.
(4) ගෙවුම් ශේෂය වේ.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ආනයන, ආදායම් වෘත්තාකාර ප්‍රවාහයේ විදීමක් (එකතුවීමක්) සඳහා උදාහරණයකි.

1.12 වෙළෙඳ ගිණුම, ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ උප ගිණුමකි.

1.13 සේවා නියුක්තිය (Employment), සාර්ව ආර්ථික (macro-economic) විචල්‍යයකි (variable).

1.14 මුළු උපයෝගිතාවය උපරිම වනවිට ආන්තික උපයෝගිතාවය ශුන්‍ය වේ.

1.15 සාමාන්‍ය පිරිවැය [Average Cost (AC)] වක්‍රයේ අවම ලක්ෂ්‍යයේදී, සාමාන්‍ය පිරිවැය [Marginal cost (MC)] වක්‍රය, ආන්තික පිරිවැය වක්‍රය ඡේදනය කරයි.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

1.16 සියලුම යෙදවුම්වල වැඩිකිරීමට වඩා අඩු සමානුපාතයකින් නිමැවුම වැඩිවන්නේ නම් …………………… *(වැඩෙන / හීනවන)* පරිමාණුකූල ඵල ඇතිවේ.

1.17 …………………… *(පුළුල් / පටු)* මුදල් සැපයුම යනුවෙන් හඳුන්වන්නේ මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකුවල මහජනයා සතු ඉල්ලුම් තැන්පතුවල එකතුවයි.

1.18 ඒකාධිකාරී තරඟයේදී, ආයතන …………………… *(දිගු කාලයේදී / කෙටි කාලයේදී)* ප්‍රාමාණික ලාභ (normal profits) පමණක් උපයනු ලැබේ.

1.19 …………………… *(ආන්තික පිරිවැය / සාමාන්‍ය පිරිවැය)* යනු එක් අතිරේක නිමැවුම් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරණු ලබන අමතර පිරිවැයයි.

1.20 ආර්ථිකයේ භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීමට තිබෙන යන්ත්‍රෝපකරණ සහ කර්මාන්තශාලා ප්‍රමාණය ආර්ථිකයක් වැඩි කරන විට, එය …………………… *[(දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product) / ප්‍රාග්ධන සමුච්චය (Capital Accumulation)]* ලෙස හඳුන්වනු ලැබේ.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) (i) "හිඟකම" (scarcity) යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(ii) තෝරා ගැනීම (choice) සහ ආවස්ථික පිරිවැය (opportunity cost) අතර වෙනස **පැහැදිලි කරන්න**.

(ලකුණු 03)

(b) සැලසුම් (සමාජවාදී) ආර්ථික ක්‍රමයේ ලක්ෂණ පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සඳහා පහත දැක්වෙන ඉල්ලුම් (Qd) සහ සැපයුම් (Qs) සමීකරණ ඔබට ලබාදී ඇත:

$$Qd = 1,500 - 6P$$

$$Qs = -100 + 2P$$

(i) භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 03)

(ii) පාරිභෝගිකයන්ගේ ආදායම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහත දක්වා ඇති සමතුලිත මිල සහ ප්‍රමාණය කෙරෙහි ඇති කෙරෙන බලපෑම **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(b) පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ලාභ උපරිම කරනු ලබන්නේ කෙසේදැයි ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) උපරිම මිල [price ceilings (maximum price)] සහ අවම මිල [price floors (minimum Price)] අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ශ්‍රී ලංකාව වැනි රටක රජයේ අයවැයෙහි අයවැය හිඟයක් තිබීමේ ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) (i) මුදලේ කාර්යයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(ii) සාමාන්‍ය මිල මට්ටම සහ මුදලේ අගය අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) (i) ආරක්ෂණවාදය (protectionism) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(ii) ආරක්ෂණවාදයේ ඇති වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) (a) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**.

(ලකුණු 03)

(b) මුල්‍ය අතරමැදිකරණය (financial intermediation) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 03)

(B) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| කෘෂිකර්මය, වන වගාව සහ ධීවර කර්මාන්තය | 10,000 |
| පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජල නිෂ්පාදන කටයුතු සහ වෙනත් කර්මාන්ත | 7,500 |
| ඉදිකිරීම් | 20,000 |
| තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, ගබඩා කිරීම, නවාතැන් සැපයීම් හා ආහාර සැපයීම් සේවා | 2,500 |
| තොරතුරු සහ සන්නිවේදන සේවා | 23,000 |
| මුල්‍ය සහ රක්ෂණ සේවා | 2,500 |
| නිවාස අයිතිය ඇතුළුව දේපළ වෙළඳාම | 4,550 |
| වෘත්තීය සේවා, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ උපකාරක සේවා ක්‍රියාකාරකම් | 3,575 |
| රාජ්‍ය පරිපාලනය, ආරක්ෂක, අධ්‍යාපනය, මානව සෞඛ්‍යය සහ සමාජ සේවා කටයුතු | 15,000 |
| වෙනත් සේවා | 5,600 |
| නිෂ්පාදිත මත බදු | 5,600 |
| නිෂ්පාදිත මත සහනාධාර | 3,250 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කල යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිලට දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 04)

(C) ආර්ථික සංවර්ධනය (Economic Development) සහ තිරසාර සංවර්ධනය (Sustainable Development) අතර වෙනස **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |